නාවික හමුදා මූලස්ථානය
නාහ. 5 කොළඹ 01

2004 ජුනි මස 07 වන දින

**<u>සංදේශය</u>**

**<u>ස්වේච්ඡා නාවික හමුදාවේ විශේෂ ක්‍රමය යටතේ බඳවාගනු ලබන නැවියන් සම්බන්ධයෙන් අදාල වන උපදෙස්</u>**

1. <u>හැඳින්වීම</u>

ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවෙහි විවිධ අංශවල විවිධ රාජකාරීන් සඳහා විශේෂ ක්‍රමය යටතේ බඳවා ගනු ලබන නැවියන් වෙනුවෙන් වූ පොදු උපදෙස් පහත දැක්වේ.

2. <u>බඳවා ගනු ලබන අංශයන්</u>

අ. ඉංජිනේරු කාර්මික (කර්මාන්ත) අංශය
ආ. සිවිල් ඉංජිනේරු අංශය
ඇ. නැව් බඳ කාර්මික අංශය
ඈ. තොරතුරු තාක්ෂණ අංශය
ඉ. ප්‍රවාහන සහායක අංශය
ඊ. විදුලි කාර්මික අංශය
උ. ක්‍රීඩා සංචිතයන් සඳහා
ඌ. නාවික හමුදාධිපතිගේ අභිමතය පරිදි විශේෂ රාජකාරි සඳහා

3. <u>බඳවා ගැනීම</u> බඳවා ගනු ලබන අවම තරාතිරම සාමාන්‍ය නැවි හා ඊට සමාන තරාතිරම වේ. බඳවාගැනීමෙන් පසු ඔවුන් අදාල ක්ෂේත්‍රයේ රාජකාරි කිරීම සඳහා පමණක් යොදවා ගනු ලබන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට බැඳී සිටිය යුතුයි.

4. <u>මූලික සුදුසුකම්/අවශ්‍යතාවයන්</u>

අ. ශ්‍රී ලාංකික පුරවැසියන් වීම
ආ. ශාරීරික අවශ්‍යතාවයන්
- i. පිරිමි : අවම උස අඩි 5 අඟල් 4 යි
  අවම බර රාː 105 යි
  පපුව අඟල් 32 ට නොඅඩු විය යුතුය
- ii. ගැහැණු: අවම උස අඩි 05 යි
  අවම බර රාː 80 යි

ඇ. වර්ණ දර්ශනය එස්ටීඩී 11
ඈ. දුර දර්ශනය 6/6 (උපැස් මගින් 6/6 ලෙස නිවැරදි කර තිබීම)
ඉ. වයස අවුරුදු 18 ත් 33 ත් අතර විය යුතුය

5. <u>අධ්‍යාපන සුදුසුකම්</u>

අ. <u>ඉංජිනේරු කාර්මික (කර්මාන්ත) අංශය</u> සාමාන්‍ය නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය සමත් විය යුතු අතර අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයකින් මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා එම ක්ෂේත්‍රයෙහි වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

ආ. <u>සිවිල් ඉංජිනේරු අංශය</u>

i. <u>තාරකරු</u> නායක නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය (09 වන වසර) සමත්වීම සහ මාර්ග නඩත්තුව පිළිබඳ පිළිගත් ආයතනයක වසර 03ක පළපුරුද්ද.

ii. <u>මාර්ග නඩත්තුකරු</u> සාමාන්‍ය නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 05 වන ශ්‍රේණිය (06 වන වසර) සමත්වීම සහ මාර්ග නඩත්තුව පිළිබඳ පිළිගත් ආයතනයක වසර 03ක පළපුරුද්ද.

iii. <u>පෙදරේරු / වඩු කාර්මික / ජලනල කාර්මික / කම්බි නැවුම්කරු / පින්තාරුකරු සහ ඇළුමිනියම් වැද්දුම්කරු</u> සාමාන්‍ය නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 05 වන ශ්‍රේණිය (06 වන වසර) සමත් විය යුතු අතර අදාල ක්ෂේත්‍රයේ මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක වසර 02කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

ඇ. <u>නැව් බඳ කාර්මික අංශය</u> සාමාන්‍ය නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 05 වන ශ්‍රේණිය (06 වන වසර) සමත් විය යුතු අතර අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

ඈ. <u>ප්‍රවාහන සහායක අංශය</u> සාමාන්‍ය නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 09 වන ශ්‍රේණිය (10 වන වසර) සමත් විය යුතු අතර බර වාහන පැදවීම සඳහා බලපත්‍රයක් සහ වසර 05කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

ඉ. <u>විදුලි/ගුවන් විදුලි කාර්මික අංශය</u>

i. සාමාන්‍ය නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය (09 වන වසර) සමත් වියයුතු අතර, අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයකින් මාස 06 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා එම ක්ෂේත්‍රයෙහි මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

ii. නායක නැවි තරාතිරම සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය (09 වන වසර) සමත් විය යුතු අතර අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා එම ක්ෂේත්‍රයෙහි වසර 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

ඊ. **<u>තොරතුරු තාක්ෂණ අංශය</u>**

i. **<u>idudkH නැවි තරාතිරම</u>**

(අ) අ.පො.ස (උ/පෙළ) පෙනී සිටීම

(ආ) අ.පො.ස (සා/පෙළ) සමත්ව තිබීම

(ඇ) පරිගණක පිළිබඳව මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර තත්වයේ පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථක ලෙස නිම කර තිබීම.

(ඈ) පිළිගත හැකි ආයතනයක පරිගණක වැඩසටහන් සම්පාදක වරයෙකු/ වෙබ්පිටු සැකසුම්කරුවකු වශයෙන් අවුරුද්දකට නොඅඩු පළපුරුද්ද.

(ඉ) POSTGRES, SQL, MY SQL, PHP භාවිතයෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

ii. **නායක නැව් තරාතිරම**

(අ) අ.පො.ස (උ/පෙළ) සමත්වීම

(ආ) ගණිතය, විද්‍යාව, සිංහල සහ ඉංග්‍රීසි ඇතුළුව අ.පො.ස (සා/පෙළ) විෂයයන් 06 කින් සමත්වීම.

(ඇ) පරිගණක පිළිබඳව අවුරුද්දකට නොඅඩු පූර්ණකාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස පිළිගත් ආයතනයකින් සමත්ව තිබීම.

(ඇ) පිළිගත හැකි ආයතනයක පරිගණක වැඩසටහන් සම්පාදකවරයෙකු වශයෙන් අවුරුදු 04 කට නොඅඩු පළපුරුද්ද.

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ රජයේ හෝ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 01 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්දක් ලබා තිබීම.

(ඉ) POSTGRES, SQL, MY SQL, PHP භාවිතයෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

උ. <u>ක්‍රීඩා සංචිත සඳහා</u> සාමාන්‍ය නැව් තරාතිරම සඳහා අවම වශයෙන් 08 වන ශ්‍රේණිය සමත් විය යුතු අතර අදාළ ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි මනා නිපුණත්වයක් තිබිය යුතුය. නාවික හමුදා ක්‍රීඩා සංචිතයන්හි සභාපතිවරුන්ගේ නිර්දේශයන් මත පමණක් බඳවා ගනු ලැබේ.

ඌ. **විශේෂ රාජකාරි සඳහා**

(1) **නායක නැව් තරාතිරමට**

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල ඇතුළුව විෂයන් 06 ක් සමත් වීම.

(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිටීම.

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ රජයේ හෝ පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

(2) **සුළු නිලධාරි තරාතිරමට**

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් 06 ක් සමත් වීම.

(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් විෂයන් 02 ක් සමත්වීම (අතිරේක විෂය හැර)

(ඇ) අදාළ ක්ෂේත්‍රයේ රජයේ හෝ පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 01 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්දක් ලබා තිබීම.

6. <u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩල</u> සම්මුඛ පරීක්ෂණ නාවික හමුදාධිපති විසින් පත්කරනු ලබන නිලධාරීන්ගෙන් සැදුම්ලත් පරීක්ෂණ මණ්ඩලයක් විසින් කරනු ලබන අතර යෝග්‍යතාවය සලකා බැලීම සඳහා අවශ්‍ය පරිදි අදාළ ක්ෂේත්‍රයෙහි ලිඛිත/ප්‍රායෝගික පරීක්ෂණයකට ද යොමු කරවනු ඇත.

7. ඉහත දක්වා ඇති සුදුසුකම්, අවශ්‍යතාවයන් මත කලින් කලට වෙනස් කිරීමේ හැකියාව නාවික හමුදාධිපති සතුවේ.

8. බඳවා ගනු ලබන පුද්ගලයන් නාවික හමුදා වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

9. විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂ කුසලතා ඇති එහෙත්, ඉහත දක්වා ඇති අධ්‍යාපනික ශාරීරික වෙනත් සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන් බඳවා ගැනීම සලකා බැලීමේ අභිමතය නාවික හමුදාධිපති සතුවේ.

10. <u>නිල අංකය</u> විශේෂ ක්‍රමය යටතේ බඳවා ගනු ලබන ස්වේච්ඡා නාවික හමුදාවේ පුද්ගලයින් පරිපාලනමය කටයුතු වලදී හඳුනාගැනීම පහසුවනු වස් ඔවුන්ගේ නිල අංකයන් පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

i. පිරිමි VAS ---------
ii. ගැහැණු WVS ---------

11. <u>සේවා කාලසීමාව</u> විශේෂ ක්‍රමය යටතේ ස්වේච්ඡා නාවික හමුදාවට බඳවාගනු ලබන පුද්ගලයින්ගේ මූලික සේවා කාලසීමාව අවුරුදු **05**ක් වන අතර, එම කාලසීමාව අවසන් වීමට පෙර ස්වේච්ඡා නාවික හමුදාවෙන් අස්කිරීමට හෝ එම කාලය අවසානයේ නැවත සේවයට බඳවා ගැනීමේ පූර්ණ අභිමතය නාවික හමුදාධිපති සතුවේ. බඳවා ගනු ලබන පුද්ගලයන් පළමු වසර තුල අනිවාර්යය සක්‍රීය සේවයේ යෙදී සිටිය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙලෙස බඳවා ගන්නා ලද ඕනෑම පුද්ගලයකු අනිවාර්යය නිවාඩු මත තැබීමේ පූර්ණ අභිමතයද නාවික හමුදාධිපති සතුවේ.

12. **<u>නැවත සේවයට බඳවා ගැනීම</u>**

(අ) මූලික සේවා කාලය අවසානයේදී වරකට අවුරුදු **05** බැගින් අදාල පුද්ගලයාගේ වයස අවුරුදු **55**ක් වනතුරු සේවා කාලය දීර්ඝ කිරීමේ පූර්ණ බලතල නාවික හමුදාධිපති සතුවන අතර එවන් අවස්ථාවකදී සෑම පුද්ගලයෙකුම පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට පෙනීසිට සමත් විය යුතුය. මෙම සේවා කාලය දීර්ඝ කිරීම සඳහා අදාල පුද්ගලයා විසින් මෙම ලිපියෙහි ඇමුණුම 'අ' වශයෙන් ඉදිරිපත් කර ඇති අයදුම්පත සම්පූර්ණ කර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව අණදෙන නිලධාරී මගින් අවුරුදු **05** බැගින් වූ සේවා කාලයන් අවසන්වීමට මාස තුනකට ප්‍රථම ස්වේච්ඡා නාවික හමුදාවේ අණදෙන නිලධාරී වෙත ඉදිරිපත් කල යුතුය. අදාල සේවා කාලය අවසානයේදී නැවත සේවයට ඉල්ලුම්කර නොමැති පුද්ගලයන්ල වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් පුද්ගලයන් හා නැවත සේවයට බැඳීමට අකමැති පුද්ගලයන් හා නැවත සේවයට බැඳීමට කැමැත්ත ප්‍රකාශ කලද, එසේ නැවත සේවයට බඳවා ගැනීම නුසුදුසු යැයි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පුද්ගලයන් ස්වේච්ඡා නාවික හමුදාවෙන් ඉවත් කරනු ලැබේ.

(ආ) නැවත සේවයට බඳවාගැනීමේ අයදුම්පත් නාවික හමුදාධිපති විසින් අනුමත කිරීමෙන් අනතුරුව එහි එක් පිටපතක් පුද්ගලික ලිපිගොනුවෙහි බහාලිය යුතුය. අනෙක් පිටපත සේවා සහතිකයෙහි බහාලීමටත් සේවා සහතිකයේ නිසි සටහන් තැබීමටත් අදාල අණදෙන නිලධාරීන් විසින් කටයුතු කල යුතුය.

13. **<u>වැටුප් රහිත අනිවාර්ය නිවාඩු ලබා ගැනීම</u>** වැටුප් රහිත අනිවාර්ය නිවාඩු ලබාගැනීමේදී ඒ සඳහා අයදුම් කිරීම මාස **3** කට ප්‍රථම අදාල අණදෙන නිලධාරීගේ සහ ස්වේච්ඡා නාවික හමුදාවේ අණදෙන නිලධාරීගේ නිර්දේශයන් සමග නාවික හමුදාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ.

14. **නැවත සක්‍රිය සේවයට කැඳවීම/අනුයුක්ත වීම** වැටුප් රහිත අනිවාර්ය නිවාඩු මත සිටින පුද්ගලයින් ස්වේච්ඡා නාවික හමුදාවේ අණදෙන නිලධාරිගේ නිර්දේශය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි නැවත සක්‍රිය සේවයට කැඳවීම සහ අනුයුක්ත කිරීම කරනු ලැබේ.

15. **උසස් කිරීම**

(අ) මෙම ක්‍රමය යටතේ බඳවා ගනු ලබන පුද්ගලයින් සෑම වසර 05ක සක්‍රිය සේවා කාලයකින් පසුව ඊළග තරාතිරමට උසස් කිරීම සඳහා (සානැවි සිට බනැවි දක්වා වසර 5, බනැවි සිට නානැවි දක්වා වසර 5) සුදුසුකම් ලබන අතර නැවියාගේ විනය හැසිරීම සහ රාජකාරි ඉටු කිරීමේ සතුටුදායක භාවය සම්බන්ධයෙන් සළකා බලා දක්වා ඇති තරාතිරම් වලට පහත සඳහන් අයුරින් උසස් කිරීම් සිදුකරනු ලැබේ. මෙම පුද්ගලයින් උසස් කිරීම් නායක නැවි තරාතිරම දක්වා පමණක් වනු ඇත.

| | | |
|---|---|---|
| i. | සාමාන්‍ය නැවි සිට බලනැවි තරාතිරමට | - ස්වේච්ඡා නාවික හමුදාවේ අණදෙන නිලධාරිගේ නිර්දේශයන් මත නාවික හමුදාධිපති විසින් |
| ii. | බලනැවි සිට නායක නැවි තරාතිරමට | - ස්වේච්ඡා නාවික හමුදාවේ අණදෙන නිලධාරිගේ නිර්දේශයන් මත නාවික හමුදාධිපති විසින් |

(ආ) අදාල නැවියන් උක්ත තරාතිරම් වලට උසස් කිරීමේ නිර්දේශයන් ඇමුණුම 'ආ' හි ආකෘති පත්‍රයට අනුව අණදෙන නිලධාරිගේ නිර්දේශයන් සමග සෑම වසරකම මැයි 01 හා නොවැම්බර් 01 වන දිනට පෙර අණදෙන නිලධාරි ස්වේච්ඡා නාවික හමුදාව වෙත ඉදිරිපත් කල යුතුය. (අවි හා පිහිණුම් ප්‍රවීනතාවය, උසස් කිරීමේ පරීක්ෂණ හා ඉතා හොඳ කාලය මෙම නැවියන්ගේ උසස් කිරීම් සඳහා සැලකිල්ලට ගනු නොලැබේ) බලනැවි සිට නායක නැවි තරාතිරමට උසස් කිරීම අදාල අංශයෙහි පවතින පුරප්පාඩු සැලකිල්ලට ගෙන නාවික හමුදාධිපති විසින් ප්‍රකාශයට පත් කරනු ඇත.

16. **ජ්‍යෙෂ්ඨතා ලේඛණය** බලනැවි හා නායක නැවි තරාතිරම් සඳහා ජ්‍යෙෂ්ඨතා ලේඛණ නාවික හමුදා මූලස්ථානයේ හා ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානයේ පවත්වාගෙන යනු ලැබේ.

17. **සේවක ගණන** නායක නැවි තරාතිරමට උසස් කිරීම ස්වේච්ඡා නාවික හමුදාවේ පවතින පුරප්පාඩු වලට අනුකූලව සිදු කරනු ලැබේ.

18. **වෛද්‍ය පරීක්ෂණය** ස්වේච්ඡා නාවික හමුදාවේ අනිකුත් නැවියන් සඳහා බලපැවැත්වෙන පරිදි වේ.

19. **විවාහ ගිවිස ගැනීම** මෙම ක්‍රමය යටතේ බඳවා ගනු ලබන ඕනෑම තරාතිරමක පුද්ගලයෙකු විවාහ ගිවිස ගැනීමේදී අණදෙන නිලධාරිගේ අවසරය ලබාගත යුතු අතර අදාල ආකෘතිපත් අනුමත කිරීමෙන් පසුව අණදෙන නිලධාරි විසින් එහි පිටපතක් ස්වේච්ඡා නාවික හමුදාවේ අණදෙන නිලධාරි වෙත ඉදිරිපත් කල යුතුය.

20. **වෛද්‍ය පහසුකම් හා නිදහස් ගමන් බලපත්‍ර** ස්වේච්ඡා නාවික හමුදාවේ අනෙකුත් නැවියන් සඳහා බලපවත්වනු ලබන පිළිවෙතට වනු ඇත.

21. **නාවික හැඳුනුම්පත** මොවුන් පැහැදිලිව හඳුනාගත හැකිවන පරිදි හැඳුනුම්පතෙහි පසුබිම ලා නිල් වර්ණයෙන් යුක්තව, ස්වේච්ඡා නාවික හමුදාවේ අනිකුත් පුද්ගලයන් සඳහා නිකුත් කරනු ලබන නාවික හැඳුනුම්පත මෙම පුද්ගලයින් සඳහාද ලබාදෙනු ලැබේ.

22. **විනයානුකූලව කටයුතු කිරීම**

අ. විශේෂ ක්‍රමය යටතේ බඳවාගන්නා ලද සියලුම ස්වේච්ඡා නාවිකයන් ස්වේච්ඡා නාවික හමුදාවේ සාමාජිකයින් බැවින් ඔවුන් නාවික නීතියට යටත් පුද්ගලයින් වේ. එබැවින් ඔවුන් සම්බන්ධයෙන් අණදෙන නිලධාරීන් හට අධිකරණ බලතල ක්‍රියාත්මක කළහැකි වේ. කෙසේ වුවද මොවුන් හට නිසි නාවික පුහුණුවක් ලබා නොදෙන බැවින් මොවුන් සම්බන්ධයෙන් අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීමේදී වරදකරුවන් වන අය හට පහත දක්වා ඇති දඬුවම් පමණක් ප්‍රදානය කිරීමට අණදෙන නිලධාරීන් වගබලා ගතයුතු වේ.

(1) බලලත් නිලධරයන් හෝ සුළු නිලධරයන් නිල තත්වයෙන් පහත හෙලීම.

(2) වැටුප් දීමනා සහ අයවිය යුතු වෙනත් දීමනා වරදකරුට දෙන ලද නිල ලාංඡන සැරසුම් හෝ එවැනි වෙනත් දේ රාජසන්තක කිරීම, තවද සේවය අත්හැර යාමකදී සේවය අත්හැරගිය තැනැත්තා විසින් නැවේ හෝ ඔහු අත්හැරගිය ස්ථානයේ දමාගිය සියලුම ඇඳුම් හා වෙනත් බඩු බාහිරාදිය රාජසන්තක කිරීම.

(3) දැඩි ලෙස තරවටු කිරීම.

(4) තරවටු කිරීම.

(5) නායක නැවි හෝ ඊට සමාන තරාතිරමේ නාවිකයින් තරාතිරමෙන් පහත හෙලීම.

(6) දින 14 ක් නොයික්මවන කාලයක් සඳහා අමතර වැඩ ප්‍රදානය කිරීම.

(7) දින 30 ක් නොයික්මවන කාලයක් සඳහා නිවාඩු නතර කිරීම.

(8) වැටුප් දඩ ප්‍රදානය කිරීම.

(9) අවවාද කිරීම.

ආ. විශේෂ ක්‍රමය යටතේ බඳවාගත් ස්වේච්ඡා නාවිකයකු වෙතින් ඉහත දැක්වෙන දඬුවම් වලට වඩා වැඩි දඬුවම් පැනවිය යුතු ආකාරයේ බරපතල අන්දමින් නාවික නීතිය උල්ලංඝනය වූ අවස්ථාවකදී ඒ පිළිබඳව සොයා බලා ඔවුන් සේවයෙන් ඉවත් කිරීම සඳහා හෝ විනයානුකූල පියවර ගැනීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස සුදුසු පරීක්ෂණ මණ්ඩලයක් පත්කර අදාල පරීක්ෂණ මණ්ඩල වාර්තාව නාවික හමුදා මූලස්ථානය වෙත ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් ලබාගෙන ඒ අනුව අදාල වැරදිකරුවන් පිළිබඳ සුදුසු කටයුතු කළ යුතුය.

ඇ. විශේෂ ක්‍රමය යටතේ බඳවාගත් ස්වේච්ඡා නාවිකයකු නිසි බලධාරියකුගේ අවසරයකින් තොරව නිවාඩු රහිතව දින 10 කට වඩා වැඩි කාලයක් කඳවුරට රපෝර්තු නොකර සිටියහොත් අදාල ආයතනයේ අණදෙන නිලධාරී විසින් එම නොපැමිණීම ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානයට පිටපතක් සහිතව නාවික හමුදා මූලස්ථානය වෙත සංඥාවක් මගින් දැනුම්දීම කලයුතු අතර, එම නාවිකයා නාවික හමුදාවෙන් ඉවත් කිරීමට කටයුතු කලයුතු වේ.

ඈ. තවද, සාධාරණීය කළ නොහැකි හේතූන් නිසා දින 10 කට අඩු කාලසීමාවක් තුන් වතාවකට වඩා නිවාඩු රහිතව කඳවුරෙන් බැහැරව සිටියහොත් එම නාවිකයා නැවත සේවයට බඳවා ගැනීම සඳහා නිර්දේශ නොකළ යුතුය.

23. **<u>නිල ඇඳුම්</u>** සක්‍රිය සේවා කාලය තුළදී මෙම ක්‍රමය යටතේ විවිධ අංශයන් වෙත බඳවා ගනු ලබන පුද්ගලයින් හට නාවික හමුදාව විසින් සපයනු ලබන නිල ඇඳුම් ඇමුණුම 'ඇ' හි පරිදි වේ.

24. **<u>නිවාඩු</u>** ස්වේච්ඡා නාවික හමුදාවෙහි අනෙකුත් නැවියන් සඳහා බලපවත්වනු ලබන පිළිවෙතට වේ.

25. **<u>සේවා සහතික/පුද්ගලික ලිපිගොනු</u>** ස්වේච්ඡා නාවික හමුදාවෙහි අනිකුත් පුද්ගලයන් සඳහා භාවිතා කරනු ලබන සේවා සහතික මෙම පුද්ගලයන් සඳහාද භාවිතා වන අතර පදක්කම් පළඳනා සහ යහපත් හැසිරීමේ ලාංජන සඳහා මෙම පුද්ගලයන් හිමිකම් නොලබනු ඇත.

26. **<u>පුහුණුව</u>** බඳවාගැනීමෙන් අනතුරුව නාවික හමුදාව පිළිබඳව දැනුවත් කිරීම සඳහා ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානයෙහි පවත්වනු ලබන දේශන මාලාවක් (සතියක) සඳහා යොමු කරවනු ලබන අතර සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අභිමතය පරිදි අදාල වෘත්තියට අනුව පුහුණුවීම් සඳහා යොමු කරවනු ලැබිය හැක.

27. **<u>වැටුප් වේතන</u>** ස්වේච්ඡා නාවික හමුදාවෙහි අනිකුත් පුද්ගලයන් මෙන් මෙම පුද්ගලයන්ද තම තරාතිරමට අදාල වැටුප්ල දීමනා, පාරිතෝෂිත හා විශ්‍රාමික වැටුප් වලට හිමිකම් ලබනු ඇත.

28. **<u>නැවතීමේ පහසුකම්</u>** නැවතීමේ පහසුකම්ද රාජකාරි කරන ප්‍රදේශ අනුව සහ රාජකාරි ස්වභාවය අනුව සැපයීමට කටයුතු කරනු ලැබිය හැක.

29. **<u>අවසන් වාර්ථා ඉදිරිපත් කිරීම</u>**

(අ) ස්වේච්ඡා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම යන සහ නිමසේවා මත තබන නැවියන්ගේ අවසන් වාර්ථා අධ්‍යක්ෂ නාවික සැපයුම් හා ලේඛනගේ අංක වැඅ/130/(අ) දරණ **2002** ජූලි **10** වන දිනැති ලිපියට අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ නාවික (වැටුප් හා විශ්‍රාම වැටුප්) වෙත සේවයෙන් විශ්‍රාම/ඉවත්ව ගොස් දින **7** ඇතුලත අණදෙන නිලධාරී ස්වේච්ඡා නාවික හමුදාව විසින් ඉදිරිපත් කල යුතුය.

(ආ) නිමසේවා මත තබන හා වැටුප් රහිත අනිවාර්ය නිවාඩු මත තබන සියළුම නැවියන්ගේ අවසන් වාර්ථා අදාල අණදෙන නිලධාරීන් විසින් නාවික හමුදා මූලස්ථානය වෙත ඉදිරිපත් කල යුතු අතර, සේවා සහතිකය හා නාහ. **08** පත්‍රය ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානය වෙත ඉදිරිපත් කල යුතුය.

30. **<u>පිටස්තර රැකියා/පිටස්තර ක්‍රීඩා සංගම් නියෝජනය කිරීම</u>** සක්‍රිය සේවය සඳහා කැඳවා ඇති අවස්ථාවන්හිදී පිටස්තර රැකියාවන්හි නියුක්ත වීම හෝ පිටස්තර ක්‍රීඩා සංගම් නියෝජනය කිරීම සපුරා තහනම් වේ.

31. **<u>අංශ අතර මාරු කිරීම</u>** විශේෂ වෘත්තිය කුසලතා සහ දක්ෂතා මත යම් අංශයකට මෙම ක්‍රමය යටතේ බඳවා ගනු ලබන පුද්ගලයන් පසු අවස්ථාවකදී වෙනත් අංශයකට මාරු කිරීම සලකා බලනු නොලැබේ.

32. **<u>වෙනත්</u>** මෙහි විශේෂ විධි විධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් ස්වේච්ඡා නාවික හමුදා රෙගුලාසීන් අදාල කර ගනු ලැබේ.

33. **1998** සැප්තැම්බර් මස **03** වන දිනැති නාහ **5** දරණ නාවික හමුදාධිපති ගේ සංදේශය මෙයින් අවලංගු කරනු ලැබේ.

ඩීඩබ්කේ සඳගිරි, විඑස්වී,යූඑස්පී,ආර්සීඩීඑස්,පීඑස්සී
වයිස් අද්මිරාල්
නාවික හමුදාධිපති

ඇමුණුම : අ. නැවත සේවයට බඳවා ගැනීමේ අයදුම්පත
ආ. උසස් කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත (නාහ (V) විශේෂ)
ඇ. විශේෂ ක්‍රමය යටතේ බඳවා ගනු ලබන පුද්ගලයින් හට නාවික හමුදාව විසින් සපයනු ලබන නිල ඇඳුම් ලැයිස්තුව

බෙදාහැරීම : සම්පූර්ණ

**ඇමුණුම 'අ'**

**2004 ජුනි මස 07 වන දින අංක නාහ. 5 දරණ සංදේශය**

**නැවත සේවයට බඳවා ගැනීමේ අයදුම්පත**
**(විශේෂ ක්‍රමය යටතේ ස්වේච්ඡා නාවික හමුදාවට බඳවා ගත් නැවියන් සඳහා)**

1. නිල අංකය ...................... දරණ ............................................................ මම ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ (විශේෂ ක්‍රමය යටතේ) නැවියකු වශයෙන් ............................. සිට අවුරුදු ............................ ක් සඳහා නැවත සේවයට බැඳීමට කැමති/අකමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

2. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවෙන් අස්කිරීම නාවික හමුදාධිපතිගේ අභිමතය පරිදි පමණක් වන බව මා විසින් අවබෝධ කරගතිමි.

3. නාවික හමුදාධිපති විසින් සක්‍රිය සේවය සඳහා මා කැඳවීමට ඉඩ ඇතිබව සම්පූර්ණයෙන්ම වටහා ගතිමි.

4. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ සේවය කිරීමට මා නුසුදුසු වුවහොත් එයින් මා අස්කරන බවද සම්පූර්ණයෙන්ම වටහා ගතිමි.

......................................
අත්සන (නිල අංකය සමග)

........................... දින
............................ දී මා ඉදිරිපිටදී
අත්සන .....................................
නම හා පදවි නාමය ............................
.............................................................

නිර්දේශ කරමි/නොකරමි

...................................
දෙපාර්තමේන්තු ප්‍රධානී

**ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදා මූලස්ථානයේ ප්‍රයෝජනය සඳහා**

වෛද්‍ය වාර්තාව: 200....................... මස ............................. දින අංක දරණ අධ්‍යක්ෂ නාවික වෛද්‍ය සේවාගේ ලිපියට අනුව නැවත සේවයට බඳවා ගැනීම සඳහා වෛද්‍ය අතින් සුදුසු/නුසුදුසු වේ.
200.................. මස ............... දින සිට ඉහත නම සඳහන් නැවියා ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ තවදුරටත් අවුරුදු ............... ක කාල සීමාවක් සඳහා නැවත සේවයට බඳවාගැනීම නිර්දේශ කරමි/ නොකරමි.

දිනය : ................................

.................................................
අණදෙන නිලධාරී
ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව

**නාවික හමුදා මූලස්ථානයේ ප්‍රයෝජනය සඳහා**

200................ මස ................. දින සිට ඉහත නම සඳහන් නැවියා ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ විශේෂ ක්‍රමය යටතේ තව දුරටත් අවුරුදු .............. ක කාලයක් සඳහා නැවත සේවයට බඳවා ගැනීම අනුමත කරමි/ නොකරමි.

දිනය : ...........................

.............................
නාවික හමුදාධිපති

**ඇමුණුම 'ආ'**

**2004 ජූනි මස 07 වන දින අංක**
**නාහ. 5 දරණ සංදේශය**
**නාහ 4 (V) විශේෂ**

**උසස් කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කිරීම**
**(විශේෂ ක්‍රමය යටතේ ස්වේච්ජා නාවික හමුදාවට බඳවා ගනු ලබන නැවියන්)**
**සාමාන්‍ය නැවි සිට බල නැවි තරාතිරම දක්වා සහ බලනැවි සිට නායක නැවි තරාතිරම සඳහා**

1. නම, තරාතිරම, නිල අංකය උසස් කිරීම කුමන තරාතිරමටද?
   ..........................................................................................................

2. අංශය
   ..........................................................................................................

3. බැඳුනු දිනය
   ..........................................................................................................

4. වර්තමාන තරාතිරමේ ජ්‍යෝෂ්ඨතාවය
   ..........................................................................................................

5. අවු 5ක සකිය සේවා කාලය ආරම්භ වන දිනය හා සම්පූර්ණ වන දිනයන්
   ..........................................................................................................

7. නැවත සේවය දිර්ඝ කර ඇති දිනයන්/සක්‍රිය සේවය ගනන් නොගැනෙන කාලයන් හා එයට හේතූන්
   ..........................................................................................................

8. දැනට යොදවා ඇති රාජකාරි
   ..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................

- (අවි/පිහිණුම් ප්‍රවීණතාවය මෙම ක්‍රමය යටතේ බඳවා ගනු ලබන නැවියන් සඳහා අදාල නොවේ.)

**අංශ භාර නිළධාරිගේ නිර්දේශයන් :**

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

දිනය: ............................ ..........................................
අංශභාර නිළධාරි

**<u>අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශ</u>**

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

දිනය :- ...............................

...........................................................
අදාල දෙපාර්තමේන්තු ප්‍රධානී

**<u>අණදෙන නිලධාරීගේ නිර්දේශය</u>**

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

............................
අණදෙන නිලධාරී

නෞකාව/ආයතනය ................................................

දිනය ................................................

**ඇමුණුම 'ඇ'**

**2004 ජුනි මස 07 වන දින අංක**
**නාහ. 5 දරණ සංදේශය**

**විශේෂ ක්‍රමය යටතේ බඳවාගනු ලබන පුද්ගලයින් හට**
**නාවික හමුදාව විසින් සපයනු ලබන නිල ඇඳුම් ලැයිස්තුව**

01.

| අනු අංකය | සංකේත අංකය | විස්තරය | පළමු ලබාදීම | නැවත ලබාදීම | සම්පූර්ණ කාලය |
|---|---|---|---|---|---|
| 01 | 031 | බැනියම් (කොට්න්) | අංක 02 | 02 | අවු. 01 |
| 02 | 033 | බැනියම් (වෙස්ට් - ක්‍රීඩා) | අංක 01 | 01 | අවු. 01 |
| 03 | 034 | කමිස නිල් (අත් කොට) | අංක 02 | 02 | අවු. 01 |
| 04 | 035 | කොට කලිසම් නිල් | අංක 02 | 02 | අවු. 01 |
| 05 | 065 | සපත්තු කැන්වස් නිල් | යුගල 01 | 01 | අවු. 01 |
| 06 | 069 | මේස් කලු | යුගල 02 | 01 | අවු. 01 |
| 07 | 085 | ගමන් මළු (කිට් බෑග්) | අංක 01 | 01 | අවු. 13 |
| 08 | 087 | ඕවරෝල් (නිල්) | අංක 03 | 02 | අවු. 01 |
| 09 | 090 | නාන තුවා | අංක 02 | 01 | අවු. 01 |
| 10 | 092 | ඇඳ ඇතිරිලි | අංක 02 | 02 | අවු. 01 |
| 11 | 093 | කොට්ට උර | අංක 02 | 01 | අවු. 01 |
| 12 | 063 | සපත්තු කලු (40 MRP) | යුගල 02 | 01 | අවු. 01 |

02. i. තොරතුරු තාක්ෂණ අංශය සඳහා මෙම ක්‍රමය යටතේ බඳවා ගනු ලබන පුද්ගලයින් සඳහා නිල ඇඳුම් සපයනු නොලැබේ.

ii. ක්‍රීඩා සංචිත සඳහා මෙම ක්‍රමය යටතේ බඳවා ගනු ලබන පුද්ගලයින් සඳහා අනු අංක 02, 04, 05 සහ 09 පමණක් සපයනු ලැබේ.